www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*නන්දිග්‍රාමයේ ජන ඝාතනයෙන් අනතුරුව*

# බටහිර බෙංගාල ස්ටැලින්වාදී මහ ඇමතිවරයාට වොෂින්ටනයට ආරාධනා කෙරේ

## In wake of Nandigram massacre
## West Bengal's Stalinist chief minister invited to Washington

**අරුන් කුමාර් සහ ක්‍රාන්ති කුමාර විසිනි**
**2007 අප්‍රේල් 21**

බුෂ් පාලනාධිකාරය, බටහිර බෙංගාල ප්‍රාන්තයේ මහ ඇමතිවරයා සහ ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂයේ (සීපීඑම්) දේශපාලන මන්ඩලයේ සාමාජිකයෙකු වන බුද්ධාදෙබ් භට්ටාචාර්ජීට එක්සත් ජනපදයේ සංචාරයක යෙදෙන්නැයි ආරාධනා කොට තිබේ. මේ වනාහි බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුවේ ආයෝජන හිතැති පිලිවෙත් සම්බන්ධයෙන් දැවැන්ත විශ්වාසයක් පල කරන යෝජනාවකි.

අප්‍රේල් 14 වන දා එක්සත් ජනපද වෙලඳ නියෝජිත සුසාන් ෂ්වාබ් විසින් භට්ටාචාර්ජී වෙත මෙම ප්‍රසිද්ධ ආරාධනය නිකුත් කරන ලද්දේ, ප්‍රාන්ත අගනුවර වන කොල්කතාවෙහි (කල්කටාවෙහි) පිහිටි ඔහුගේ කාර්යාලයේ දී ඇය හා ඉහල පෙලේ එක්සත් ජනපද ව්‍යාපාරික නියෝජිත කන්ඩායමක් මහ ඇමතිවරයා සමග වෙලඳාම හා ආයෝජන පිලිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ය.

"එක්සත් ජනපදයෙහි පදනම්ව ඇති බොහෝ සමාගම් විසින්" දැනට මත් භට්ටාචාර්ජීට එක්සත් ජනපදයට පැමිනෙන ලෙස ආරාධනා කොට ඇති බව ගැන සැලකිල්ල යොමු කිරීමෙන් පසුව ෂ්වාබ් මෙසේ පැවසී යඃ "අද දවසේ මම මෙම ආරාධනාවන් අතරට මගේ හඬත් එක් කරනවා. ඔහුගේ සාර්ථකත්වයේ දේශපාලනික හා සංවර්ධනාත්මක පැතිකඩ ගැන අහන්න අපි කැමති යි" (අවධාරනය ඇඳිනි).

එක්සත් ජනපද ආරාධනාව සිදු වූයේ බටහිර බෙංගාලයේ සීපීඑම් නායකත්වය සහිත වාම පෙරමුනු ආන්ඩුවේ අන පරිදි ක්‍රියා කරමින් ආරක්ෂක හමුදාවන් නන්දිග්‍රාමයේ දී ගොවීන් 14 දෙනෙකු ඝාතනය කොට 70කට අධික සංඛ්‍යාවකට තුවාල සිදු කිරීමෙන් හරියට ම මසකට පසුව ය. ඉන්දුනීසියාවෙහි පදනම්ව ඇති සලිම් ගෲප් සමාගමේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වීමට නියමිත විශේෂ ආර්ථික කලාපයක් සඳහා ඉඩම් අක්කර 10,000ක් අත්පත් කර ගැනීම පිනිස වූ ප්‍රාන්ත ආන්ඩුවේ සැලසුම්වලට එරෙහිව පැන නැගුනු විරෝධතාවන් මගින් කොල්කතාවෙන් කිලෝමීටර 150ක් පමන දුරින් පිහිටි ග්‍රාමීය ප්‍රදේශයක් වන නන්දිග්‍රාමය මාස ගනනක් තිස්සේ ඇලලී ගොස් තිබුනි.

ප්‍රදේශය තුල ආන්ඩුවේ අධිකාරය යලි තහවුරු කිරීමේ නාමයෙන් නන්දිග්‍රාමයට කඩා වැදීම සඳහා වාම පෙරමුනු ආන්ඩුව යුද ඇඳුම්-ආයිත්තම්වලින් දැවැන්ත ලෙස සන්නද්ධ වූ 4,000කට අධික ආරක්ෂක හමුදාවන් බලමුලු ගැන්වී ය. පොලීසිය වෙඩි තැබීමට පටන් ගත්තේ ස්වයං ආරක්ෂාව පිනිස යැයි කියා පාමින් එය අනතුරුව ජන ඝාතනය යුක්ති සහගත කිරීමට උත්සාහ කලේ ය. එහෙත් ඇසින් දුටුවන්ගේ සාක්ෂ්‍ය අනුව මෙන් ම එක් පොලිස් භටයෙකු වත් බරපතල තුවාල ලැබීමකට ගොදුරු නොවූයේ ය යන කරුන මගින් මෙය ව්‍යාජයක් බවට පත් කෙරුනි.

අන්තර් ජාතික සංගතයක් වෙනුවෙන් ආන්ඩුව ගත් පියවරක් හේතු කොට ගෙන තම ජීවනෝපාය තමන්ගෙන් උදුරා ගැනීම නතර කර ලීමට උත්සාහ දැරූ ගොවීන්ට එරෙහිව සිදු කල ජන ඝාතනය ඉන්දියාව පුරා දැවැන්ත විරෝධයක් අවුලුවා ලී ය.

එහෙත් සිය "කාර්මීකරන" ප්‍රතිපත්තිය -- එනම් ලාභ ශ්‍රමය හා ආයෝජන හිතැති බදු හා නියාමන තන්ත්‍රයක් සොයා යන ඉන්දියානු හා ජාත්‍යන්තර ප්‍රාග්ධනය උදෙසා බටහිර බෙංගාලය ආකර්ෂනීය ස්ථානයක් බවට පත් කිරීම -- පෙරට ගෙන යන බවට වාම පෙරමුනු ආන්ඩුව තරයේ ප්‍රකාශ කොට තිබේ. ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂය, එනම්, වාම පෙරමුනු සන්ධානයේ ප්‍රධාන හවුල්කාර ස්ටැලින්වාදී පක්ෂය, මෙම මස මුල දී පැවැත්වූ මධ්‍යම කාරක සභා රැස්වීමක දී පොලීසිය නන්දිග්‍රාමයෙහි සිදු කල ක්‍රියාවන් ආරක්ෂා කල අතර, "එස්යූසීඅයිය [ඉන්දියාවේ සමාජවාදී එකමුතු මධ්‍යස්ථානය], නක්සලයිට්වරුන් හා මාඕවාදීන් වැනි අතිශය කඩාකප්පල්කාරී කන්ඩායම් සමග ත්‍රිනමූල් කොන්ග්‍රසය [හින්දු අධිපතිවාදී බීජේපීයේ ප්‍රාදේශීය සහකරුවෙකි] දේශපාලනිකව කල්ලි ගැසීමක්" යැයි සඳහන් කරමින් ගොවි ජන උද්ඝෝෂනය නොතකා හැරියේ ය.

බටහිර බෙංගාලය "ආයෝජකයන්ට හිතපක්ෂපාතී" තත්ත්වයට පත් කිරීම පිලිබඳව වූ තමන්ගේ ස්වයං ප්‍රකාශිත එල්ලය සම්බන්ධයෙන් බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුව සහ සීපීඑම් අතිමහත් උනන්දුවකින් කටයුතු කරන්නේ ය යන්න ගැන බුෂ් පරිපාලනයට යම් හෝ

සැකයක් පැවතියේ නම්, ප්‍රාග්ධනයේ ප්‍රාර්ථනාවන්ට බලාත්කාරයෙන් ක්‍රියාවට දැමීම සම්බන්ධයෙන් ස්ටැලින්වාදීන් පල කරන්නා වූ අනුකම්පා විරහිත බව මගින්, එය එසේ නොවන බවත් එම ආන්ඩුව හා පක්ෂය වනාහි එක්සත් ජනපදයට ගනුදෙනු කල හැකි හා එක්සත් ජනපදය ගනුදෙනු කල යුතු තන්ත්‍රයක් බවත් ඔවුන්ට පැහැදිලිව ම ඒත්තු ගන්වා තිබේ.

ඉන්දියාවේ පාලක ප්‍රභූව සමග එක පෙලට සිටිමින්, පෞද්ගලීකරනය, රෙගුලාසිහරනය, කෘෂිකාර්මික භාන්ඩවල මිල සහනාධාර පහත හෙලීම සහ පොදු සේවාවන් හා සාමාජීය වැඩ පිලිවෙලවල් බිඳ විසිරවීම මෙන් ම විදේශීය ප්‍රාග්ධනය ආකර්ෂනය කර ගැනීම හා අපනයනය මුල් කොට ගත් වර්ධනයකට තත්ත්වය සකස් කිරීම සඳහා වූ තල්ලුවට 1991 පටන් ම සීපීඑම් සහ වාම පෙරමුන බටහිර බෙංගාලය තුල දී මෙන් ම ජාතික පරිමානව ද සහාය දී තිබේ.

නව-ලිබරල්වාදී "ප්‍රතිසංස්කරන" හා එක්සත් ජනපදය සමග "මූලෝපායික හවුල්කාරිත්වයක්" ගොඩ නගා ගැනීම උදෙසා කැප වී සිටින ආන්ඩුවක් වන කොන්ග්‍රස් පක්ෂය නායකත්වය දෙන ඉන්දියාවේ එක්සත් ප්‍රගතිශීලී සන්ධාන (යූපීඒ) හවුලට සිය බලය රැක ගැනීම සඳහා අවශ්‍ය කරන්නා වූ පාර්ලිමේන්තු ඡන්ද ලබා දෙමින් 2004 මැයි මස පටන් ම වාම පෙරමුන ඊට සහාය දී තිබේ.

එහෙත් පසු ගිය 18 මස තිස්සේ බටහිර බෙංගාල ආන්ඩුව හා සීපීඑම් ප්‍රාග්ධනය ආකර්ෂනය ගැනීමේ සිය උත්සාහයේ දී වඩ වඩාත් අප්‍රමාදීව කටයුතු කරන තත්ත්වයකට පත්ව තිබේ. වාම පෙරමුන 2006 මැයි මස පැවති බටහිර බෙංගාල ප්‍රාන්ත මැතිවරනයෙන් යලි බලය අත් කර ගැනීම සඳහා ගෙන ගිය සිය උද්ඝෝෂන ව්‍යාපාරයේ කේන්ද්‍රීය ලක්ෂ්‍යය බවට තමන්ගේ " කාර්මීකරන ප්‍රතිපත්තිය" පත් කල අතර, සිය පක්ෂය සියලු පන්තිවල සහාය දිනා ගැනීමට පලමු වතාවට උත්සාහයක යෙදී සිටින බවට සීපීඑම් නායකයෝ එහි දී විවෘතව පුරසාරම් දෙඩූහ.

නන්දිග්‍රාමයේ ගොවීන්ට එරෙහිව පොලීසිය මුදා හැරීමේ සිද්ධියට කලින්, වාම පෙරමුනු ආන්ඩුව, ටාටා මෝටර් රථ කම්හලක් උදෙසා සින්ගුර්හි ඉඩම් අක්කර 1,000ක් අත්පත් කර ගැනීම හා ප්‍රදේශය තුල කිසිදු උද්ඝෝෂනයක් සිදු කිරීම නීති විරෝධී බවට ප්‍රකාශයට පත් කරනු පිනිස පසු ගිය වසර අග දී විජිත යුගයෙහි අතිදරුනු නීති යොදා ගත්තේ ය.

පුවත්පත් වාර්තාවන්ට අනුව, එක්සත් ජනපදයට පැමිනෙන ලෙස කෙරෙන නිල ආරාධනාවක් සිදු කර ගැනීම සඳහා භට්ටාචාර්ජී මාස ගනනාවක් තිස්සේ උපක්‍රම යොදමින් සිටියේ ය. ඒ, බටහිර බෙංගාලයේ පවත්නා වාසි සහගත තත්ත්වයන් පෞද්ගලිකව ම එක්සත් ජනපද සංගත ප්‍රභූවට අලෙවි කිරීමේ අවස්ථාවක් තමන්ට ලබා ගනු පිනිස ය.

මාර්තු 7 වන දා, කොල්කතාවෙහි එක්සත් ජනපද කොන්සල් ජෙනරාල්වරයා වන හෙන්රි වී. ජාර්ඩින් ඉන්දු-එක්සත් ජනපද ව්‍යාපාරික මන්ඩලය අමතා "බටහිර බෙංගාලයේ ආර්ථික හා ව්‍යාපාරික තත්ත්වයන් පිලිබඳ ඇගයීමක්" යන මැයෙන් වූ කතාවක් කලේ ය. විවිධ " ධනාත්මක" ආර්ථික දර්ශකයන් පිලිබඳව සඳහන් කිරීමෙන් හා ව්‍යාපාරික හිතවාදී චර්යා රටාව සම්බන්ධයෙන් බටහිර බෙංගාල ආන්ඩුවට ප්‍රශංසා කිරීමෙන් අනතුරුව ජාර්ඩින් මෙසේ කියා සිටියේ ය: "වත්මන් රටාව දිගින් දිගට ම පැවතුන හොත්, එක්සත් ජනපද ආයෝජනය හා වානිජ්‍යය බටහිර බෙංගාලයෙහි වේගයෙන් වර්ධනය වන ආර්ථිකයට දායක වනු ඇත යන්න මම වඩා ඉහල මට්ටමකින් පූර්වාපේක්ෂා කරනවා."

"පෞද්ගලික අංශය දෝෂ දර්ශනයට ලක් කිරීමේ පිලිවෙතින් ඉවත් වී එය වැලඳ ගැනීම පිනිස, නැත් නම් ඩෙංග් ෂියාඕපිංග් නිතර පැවසූ 'මීයන් අල්ලන තාක් කල් බලලා සුදු ද කලු ද කියන එක ප්‍රශ්නයක් නෙවි' යන කියමනේ සාරය අනුව, අඩු ගනනේ පෞද්ගලික අංශය පිලිගැනීමට වත් බටහිර බෙංගාල නිලධරයන් පෙරට ගියේ මෑත වසරවල දි" යි ප්‍රකාශ කරමින් ජාර්ඩින් වාම පෙරමුනු ආන්ඩුවේ පිලිවෙත්වල සිදු වූ මෑත කාලීන වෙනස්කම් සම්බන්ධයෙන් පැහැදිලි සැඳහුමක් සිදු කලේ ය.

ප්‍රාග්ධනය සඳහා "දොර විවර කිරීමේ" චීන ස්ටැලින්වාදී ආන්ඩු ප්‍රතිපත්තියේ නිර්මාතෘවරයා වන ඩෙංග් ෂියාඕපිංග්ගේ කියමන උපුටා දැක්වීම අහඹු සංසිද්ධියක් නො වේ. එංගලන්ත කාර්මික විප්ලවය සමයේ පැවති තත්ත්වයන් බඳු කොන්දේසි යටතේ චීන ව්‍යවසායකයන් හා අන්තර් ජාතික සංගතයන් උදෙසා කම්කරුවන් වහල් මෙහෙයෙහි යෙදී සිටින්නා වූ සහ ජනගහනයේ බහුතරය විධිමත් සෞඛ්‍ය ආරක්ෂනයක් නැතිව සිටින්නා වූ චීනය "සමාජවාදී" යැයි මහත් සේ වගවර්නනා කරන සීපීඑම් නායකත්වය, චීනය බටහිර බෙංගාලය කාර්මීකරනය කිරීමේ තම වත්මන් තල්ලුව සඳහා වූ "ආදර්ශ ආකෘතියක්" යැයි ප්‍රකාශ කරයි.

බටහිර බෙංගාල ආන්ඩුව සාමාන්‍ය බදු හා රෙගුලාසි අත් හල විශේෂ ආර්ථික කලාප පිහිටුවීම සම්බන්ධයෙන් පමනක් නො ව කම්කරු පන්තික අතෘප්තිය ම්ලේච්ඡ ලෙස මර්දනය කිරීම සම්බන්ධයෙන් ද චීන කොමියුනිස්ට් පක්ෂ පාලන තන්ත්‍රය අනුකරනය කරනු ඇතැයි ජාර්ඩින් හා බුෂ් පරිපාලනය අපේක්ෂා කරයි.

චීන ආකෘතියට අනුව කටයුතු කරමින්, බටහිර බෙංගාල කම්කරුවන්ගේ සටන්කාමී සම්ප්‍රදාය මැඩ ලීම පිනිස දරන සිය උත්සාහයේ දී භට්ටාචාර්ජී කිසි දා නොවූ අයුරින් ආක්‍රමනශීලී වී තිබේ. තොරතුරු තාක්ෂන හා තොරතුරු තාක්ෂනයෙන් බල ගැන්වුනු (ව්‍යාපාරික ක්‍රියාදාම) කර්මාන්තවල වර්ජන සාර්ථක ලෙස නීති විරෝධී තත්ත්වයට පත් කල පලමු ප්‍රාන්තය බටහිර බෙංගාලය යි. 2005 සැප්තැම්බරයෙහි, යූපීඒ ආන්ඩුවේ දක්ෂිනාංශික ආර්ථික පිලිවෙත්වලට එරෙහිව පැන නැගි

එක් දින වර්ජනයක් මගින් මෙකී අංශවලට බාධා පැමිනුනු විට, එවන් බාධාවන් යලි ඇති නොවන බවට තම ආන්ඩුව සහතික වන්නේ යැයි ව්‍යාපාරික නායකයන්ගේ රැස්වීමක් අමතමින් භට්ටාචාර්ජී පොරොන්දු විය: "[වර්ජන පිලිබඳව වූ] මෙම අන්තරාය ගැන මම දන්නවා. අනාගතයේ එවැනි දේ සිදු කරන්නන්ට විරුද්ධව ඉහල ම දැඩි පියවර ගන්නා බවට මට ඔබට සහතික විය හැකි යි. පරිපාලනමය හා දේශපාලනික තලයේ දී මම මෙම ගැටලුව සම්බන්ධයෙන් කටයුතු කරනවා."

භට්ටාචාර්ජී හා සීපීඑම් නායකත්වය වර්ජන වැලැක්වීමේ, නැති නම් කම්කරු නොසන්සුන්තාව යටපත් කොට දැමීමේ අරමුනින් යුතුව සීපීඑම්හට අනුබද්ධ කාර්මික වෘත්තීය සමිති සම්මේලනය (සීඅයිටීයූ) මත වඩ වඩාත් දැඩි වන පීඩනයක් යොදා තිබේ.

මාර්තු 13 වන දා, හින්දුස්ථාන් මෝටර්ස් සමාගමට අයත් උත්තරපාරා කම්හලේ දී කම්කරුවන් 15 දෙනෙකු සේවයෙන් පහ කිරීමට හා දෙමසක වැටුප් නොගෙවීමට විරෝධය පල කිරීම පිනිස කම්කරුවන් වර්ජනයට පිවිසි විට සීඅයිටීයූව එම ක්‍රියාමාර්ගයට විරුද්ධත්වය පල කලේ ය. භට්ටාචාර්ජීගේ පිලිවෙත ප්‍රතිරාවය කරමින් සීඅයිටීයූ සමිති නායක සන්තාශ්‍රී චැටර්ජී ප්‍රකාශ කලේ මෙය යි: " මේ මොහොතේ කම්හලේ නිෂ්පාදනය නතර කිරීම හරි දෙයක් නෙවි. වර්ජනය මගින් නො ව සාකච්ඡාව මගින් මාස දෙකේ වැටුප ලබා ගැනීම වඩා වැදගත්."

සීඅයිටීයූවේ විරුද්ධත්වය වාචික ප්‍රකාශවලට පමනක් සීමා වූයේ නැත. මාර්තු 28 වන දා කම්කරුවන් කන්ඩායමක් සංවිධානය කර ගත් සීඅයිටීයූව ප්‍රතිවාදී වෘත්තීය සමිති දෙකකට අයත් කම්කරුවන් විසින් පවත්වා ගෙන ගිය පිකට් වැට අතරින් කම්හල තුලට යාමට ඔවුන් මෙහෙයවී ය. කම්හල් ගේට්ටුවෙන් ඇතුලට ගිය වහාම සීඅයිටීයූව නායකත්වය දුන් කන්ඩායම ආපසු හැරී වර්ජකයන්ට බෝතල්වලින් හා ගඩොල්වලින් පහර දුන්හ.

ස්ටේට්ස්මන් පුවත්පතට අනුව, අප්‍රේල් 15 වන දා කොල්කතා නගරබද හූග්ලි ප්‍රදේශයෙහි පිහිටි ගංගෙස් ජූට් කම්හලේ දී පොලීසිය හා සීඅයිටීයූ මැරයෝ වර්ජක කම්කරුවන්ට පහර දුන්හ.

## අධිරාජ්‍ය විරෝධී වාචාල කතා

වාම පෙරමුන, විශේෂයෙන් ම සීපීඑම්, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සහ ඉරාකයෙහි සිදු කල එක්සත් ජනපද ආක්‍රමනය හා වාඩි ලා ගැනීම සම්බන්ධයෙන් බොහෝ සෙයින් විරෝධය පල කර තිබේ.

2005 නොවැම්බරයේ දී ඔවුහු ඉන්දියානු හා එක්සත් ජනපද ඒකාබද්ධ යුද අභ්‍යාසයකට එරෙහිව බටහිර බෙංගාලය තුල දැවැන්ත විරෝධතා සංවිධානය කලහ. යුද අභ්‍යාසයට කිසිදු ආකාරයකින් බාධාවක් සිදු නොවන බවට තම ප්‍රාන්ත පරිපාලනය වග බලා ගනු ඇතැයි භට්ටාචාර්ජී ඉන්දියානු අගමැති මන්මෝහන් සිංට පෞද්ගලිකව සහතික වී ඇතැයි ප්‍රසිද්ධියට පත් වූයේ එම උද්ඝෝෂනවලින් පසුව ය.

2006 මාර්තුවේ දී එක්සත් ජනපද ජනාධිපති බුෂ් ඉන්දියාවේ සංචාරය කල අවස්ථාවේ ස්ටැලින්වාදීහු ඒ හා සමාන ම දැවැන්ත විරෝධතා සංවිධානය කලහ. සංචාරය අතරතුර දී බුෂ් හා ඉන්දියානු අගමැති මන්මෝහන් සිං එක්ව ඇති කර ගත් ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම ඔවුන් දැඩි ලෙස විවේචනයට ලක් කලේ, එම ගිවිසුම හරහා ඉන්දියාව පරාධීන සම්බන්ධතාවකට හසු කර ගැනීමට වොෂින්ටනය උත්සාහ දරන්නේ යැයි අනතුරු අඟවමිනි,

ස්ටැලින්වාදීන්ගේ "එක්සත් ජනපද විරෝධී" වාගාලාප කාර්යයන් දෙකක් උදෙසා සේවය කරයි. පලමුව, ආක්‍රමනකාරී හා පිරිහෙමින් පවතින එක්සත් ජනපදය සමග හාදකම් ඇති කර ගැනීමෙන් පැහැදිලිව ඈත් වී සිටීම මගින් ඉන්දියාවේ භූ දේශපාලනික අවශ්‍යතාවන්ට වඩා හොඳ සේවයක් සැලසෙන්නේ යැයි ගනන් බලන ඉන්දියානු පාලක ප්‍රභූවේ කන්ඩායමට එය තල්ලුව දෙයි. දෙවනුව, එය දේශපාලනික ආවරනයක් ලෙස සේවය කරයි. එනම්, සාමාජීයව ගිනි අවුලුවන සුලු සමාජ ආර්ථික න්‍යාය පත්‍රයක් හා වොෂින්ටනය සමග මූලෝපායික හවුල්කාරිත්වයක් අනුගමනය කරන, ඉන්දියානු ධනේශ්වරයේ සාම්ප්‍රදායික ආන්ඩු පක්ෂය වන කොන්ග්‍රසය නායකත්වය දෙන, ඉන්දියානු ආන්ඩුවකට සීපීඑම් හා වාම පෙරමුන දිගින් දිගට ම සපයන සහායට සහ බටහිර බෙංගාල ආන්ඩුවේ ම ආයෝජන හිතැති න්‍යාය පත්‍රයට ආවරනයක් ලෙස එය සේවය කරයි.

තීක්ෂන දේශපාලන විශ්ලේෂනයක් සම්බන්ධයෙන් නම් බුෂ් පාලනාධිකාරය ප්‍රසිද්ධයක් අත්පත් කර ගෙන නැති තරම් ය. එහෙත් වාම පෙරමුනු ආන්ඩුව ප්‍රාග්ධනය වෙනුවෙන් ගොවීන් වෙඩි තබා ඝාතනය කිරීමත් සමග සීපීඑම්හි "එක්සත් ජනපද විරෝධී" වාගාලාපවල නියම ස්වභාවය බුෂ් පාලනාධිකාරයට මැන ගත හැකිව ඇත.

© www.wsws.org